www.agaram.lk

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 8 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 8 ශ්‍රේණිය

කාලය : පැය $1\frac{1}{2}$
Time : $1\frac{1}{2}$ hours

## Dancing

## නර්තනය (දේශීය)

Name :- ...................................................... Grade : -............... Index number:-....................

Agaram.LK - Keep your dreams alive!

I කොටස

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. උඩරට නර්තන සම්ප්‍රදායේ පා සරඹ සබරගමු සම්ප්‍රදායේදී,

(i) පා සරඹ (ii) ඉලංගම් සරඹ

(iii) දොම්න පද (iv) මණ්ඩි පද

02. බලි ශාන්ති කර්මවල ගායනා කරනු ලබන කවි විශේෂයකි,

(i) සෙත් කවි (ii) අෂ්ඨක කවි

(iii) සිරස පාද කවි (iv) ශ්ලෝක

03. මාත්‍රා 12/123 තාල රූපය හඳුන්වන්නේ,

(i) සුළු මැදුම් දෙතිත ලෙසය. (ii) සුළු මහ දෙතිත ලෙසය.

(iii) සුළු මහ දෙතිත ලෙසය. (iv) මැදුම් මහ දෙතිත ලෙසය.

04. පෙරහැර නර්තනයක ගැමි නැටුම් ලෙස දැකිය හැක්කේ,

(i) බුලත් පදය (ii) කොතල පදය

(iii) කාවඩි (iv) පතුරු

05. පොල්/ කිතුල් ලී වර්ග යොදා ගන්නා ආතත වාද්‍ය භාණ්ඩයක් වන්නේ,

(i) පහතරට බෙරයයි. (ii) ගැට බෙරයයි.

(iii) රබාන යි. (iv) දවුලයි.

06. උඩරට සම්ප්‍රදායේ වන්නම් ගණන කීයද?

(i) 24 කි. (ii) 18 කි.

(iii) 32 කි. (iv) 16 කි.



agaram.lk

www.agaram.lk

සියලු ... ඇවිරිණි All Rights Reserved

07. "සූරිය කුළ ඇති හිරු දෙවියන්නේ," කවිය අයත් ගැමි නැටුම වන්නේ,

(i) ලී කෙළි (ii) කලගෙඩි

(iii) සවරම් (iv) පතුරු

08. "රුහුණු බෙරය" විවිධ නම් වලින් හඳුන්වයි. නිවැරදි පිළිතුර වන්නේ,

(i) යක් බෙරය, දික් බෙරය, සෝෂක බෙරයයි. (ii) තම්මැට්ටම, දවුල, සෝෂක බෙරයයි.

(iii) ගැට බෙරය, දික් බෙරය, යක් බෙරයයි. (iv) දවුල, තාලම් පට, උඩැක්කියයි.

09. "අගය වඩන කවි වරුණ........" ඉතිරි පදය වන්නේ,

(i) කෙහෙතු විමන දැකනෙතිනා (ii) රඟය දැනෙයි කළ රචනා

(iii) කල දුදනා නැත ඔබිනා (iv) මහතුගේ අවසර..... රැගෙන සමාවා

10. බාල්කයක කැටයම් කර ඇති ලී කෙළි නැටුමක් දක්නට ලැබෙනුයේ,

(i) සීගිරිය (ii) ඇම්බැක්කේ දේවාලයේ.

(iii) ලෝවා මහ පාය (iv) යාපහුව දළදා මාලිගයේ ය.

❖ කොටුව තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැනට ලියන්න.

| |
|---|
| සුරල් තට්ටුව/ දණ්ඩි කඳ/ තුරඟා/ හයි තට්ටුව / සිරස පාද/ දුර්ගා/ ලක්ෂමී |

11. පා සරඹ නැටීමේ දී ........................................ භාවිතා කරයි.

12. 12/123 තාලයට .................................. වන්නම අයත් වේ.

13. පහතරට බෙරයේ වම් ඇස හඳුන්වන්නේ ...............................

14. ආතුරයාගේ හිස සිට පාදාන්තය තෙක් දොස් දුරු කරන්නේ ...................................... වලිනි.

15. විටෙක "කාලි අම්මාන්" ලෙසත් ........................................... දෙවියන් ලෙසත් හඳුන්වයි.

❖ නිවැරදිව (✓) ලකුණු ද වැරදි නම් (×) ලකුණු ද යොදන්න.

16. නර්තනය යනු අවකාශය තුල කරනු ලබන විධිමත් චලන හැසිර වීමකි. ( )

17. යක් තොවිල්වලදි පහතරට බෙරය වාදනය කරයි. ( )

18. මැඳුම් තනි තිතට වෛරෝඩි වන්නම නටනු ලබයි. ( )

19. දින 10 ක් පුරාවට ශිව රාත්‍රි පූජාව පවත්වයි. ( )

20. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික නර්තනයන් 05 කි. ( )

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

## II වන පත්‍රය - නර්තනය

❖ ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.

01. (i) පහතරට බෙරය හඳුන්වන නම් 03ක් ලියන්න. (ලකුණු 03 යි.)

(ii) පහතරට බෙරයේ දිග ප්‍රමාණය ලියා බෙර ඇසට යොදා ගන්නා සම් වර්ගය ලියන්න. (ලකුණු 02 යි.)

(iii) පහතරට බෙරය ඇඳ කොටස් 03ක් නම් කරන්න. (ලකුණු 05 යි.)

02. (i) නවරාත්‍රී උත්සවය පැවැත්වීමේ අරමුණු 3ක් ලියන්න. (ලකුණු 02 යි.)

(ii) නවරාත්‍රී උත්සවය හා බැඳි ආගමික සම්බන්ධතාව විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(iii) එම උත්සවයෙහි දක්නට ලැබෙන ගායනා හා චාරිත්‍ර විධි පිළිබඳ විස්තරයක් ලියන්න. (ලකුණු 04 යි.)

03. (i) මාත්‍රා 3+3 තාල රූපයට බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 02 යි.)

(ii) මැදුම් තනිතිතට අදාළ කවියක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iii) චාමර කවියක් ලියා දක්වන්න. (ලකුණු 04 යි.)

04. (i) රූ කම් දක්නට ලැබෙන ස්ථාන 03 ක් නම් කරන්න (ලකුණු 03 යි.)

(ii) නර්තන ඉතිහාසයේ විවිධ වාදන භාණ්ඩ භාවිත කළ බවට සාධක ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iii) නර්තනයට සබඳකම් ඇති ඓතිහාසික මූලාශ්‍ර ඇසුරින් රූකම් වර්ග තුනක් ලියන්න. (ලකුණු 03 යි.)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

www.agaram.lk
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
Agaram.LK - Keep your dreams alive!
agaram.lk